unit 10

# ගැටුම් හා නිරාකරනය

වාගීෂ්වර

- ගැටුම් හැඳින්වීම
- ගැටුම් සම්බන්ධ නිර්වචන
- ගැටුම්වල ඓතිහාසික විකාශනය
- ගැටුම් ඇතිවීමට බලපාන සාධක (ගැටුම් මූලාශ්‍ර)
- ගැටුම් ත්‍රිකෝණය
- ගැටුම්වල ලක්ෂණ
- ගැටුමක අවස්ථා
- ගැටුම් වර්ගීකරණය
- ගැටුමක සාධනීය ලක්ෂණ
- ගැටුමක ප්‍රතිශේධනීය ලක්ෂණ
- ගැටුම් සංවර්ධනයට බාධාවක් ලෙස
- ගැටුම් නිරාකරණ සංකල්පය
- සාම අධ්‍යාපනය

sureka wageeshwara

- ## ගැටුම් හැඳින්වීම.

ගැටුම (**Conflict**) යන වාක් සංකේතය බහු අර්ථ සහිත පදයකි. ශාස්ත්‍රීය න්‍යායික පදනමකින් ඇත් වූ සාමාන්‍යය ව්‍යවහාරය තුළ ගැටුම යන අර්ථය ප්‍රකාශනය කිරීම සඳහා ආරවුල (**Dispute**) - අර්බුධය (**Crisis**) - සටන (**Fight**) - ප්‍රචණ්ඩත්වය (**Violence**) යන වාක් සංකේතයන් භාවිතා කරයි. නමුත් ශාස්ත්‍රීය න්‍යායික පදනමකින් විග්‍රහකරන කල්හි "ගැටුම" සහ උක්ත වාක් සංකේතයන් අතර පැහැදිලි වෙනස්කම් පවතී.

ගැටුම සමාජයේ සෑම ස්ථරයකම හඳුනාගත හැකි පොදු සමාජ සංසිද්ධියකි. සමාජය තුළ පවත්නා නෛසර්ගික ගුණාංගයක් වන බහුවිධතාවයේ (විවිධත්වය) ප්‍රතිඵලයක් ලෙස ගැටුම හැඳින්විය හැකිය. මානව සමාජය තුළ විවිධ පුද්ගලයන් ජීවත් වෙති. ඔවුන් ශරීර හැඩයෙන් , වර්ණයෙන් , ප්‍රමාණයෙන් , බුද්ධියෙන් , සමාජ තරාතිරමෙන් විවිධ වෙති. එම බහුවිධතාවය නිසා සෑම සමාජ ස්ථරයකම ගැටුම පවතී.

ස්වභාවයෙන්ම පුද්ගලයන්ගේ ආශාවන් - අවශ්‍යතාවයන් - අරමුණු - අනාගත අපේක්ෂාවන් - ඇගයුම් - පිළිගැනීම් - විශ්වාසයන් විවිධ වේ. ද්විතියිකව ආගම - භාෂාව - කුළය - වර්ගය - වර්ණය - සංස්කෘතිය - ප්‍රදේශය වැනි "අනන්‍යතා නිර්මාපකයන්" මගින් එම විවිධත්වය වර්ධනය කිරීමට අදාළ විශාල භූමිකාවක් රඟ දක්වයි. මෙවැනි වාස්තවික තත්ත්වයන් මත ගැටුම නොවැලැක්විය හැකි සමාජ ප්‍රපංචයක් බවට පත්ව තිබේ.

එකම කරුණක් හෝ සිද්ධියක් සම්බන්ධයෙන් මානව ජීවීන් විවිධ මත දරයි. එහි නියත ප්‍රතිඵලය වන්නේ ගැටුම (ගැටීම) උත්පාද වීමයි.

- ## ගැටුම් සම්බන්ධ නිර්වචන.

  - ගැටුම් සම්බන්ධයෙන් පලවී ඇති පොදු නිර්වචන.

"ගැටුම යනු සරලව දක්වන්නේ නම් පුද්ගලයන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් අතර, පාර්ෂව දෙකක් හෝ වැඩි ගණනක් අතර, රාජ්‍යය දෙකක් හෝ වැඩි ගණනක් අතර දක්නට ඇති නොඑකඟතාවයක් හෝ කළහකාරී තත්ත්වයකි."

"එකිනෙකට පරස්පර අදහස් ඇති පුද්ගලයන් දෙදෙනෙකු හෝ වැඩි පිරිසක් වාචික ලෙස, කායික ලෙස හෝ ආයුධ මගින් කරන අරගලය ගැටුම වේ."

  - ගැටුම් සම්බන්ධයෙන් පලවී ඇති දාර්ශනික නිර්වචන.

"තරඟකාරී අභිලාෂයන් , විවිධ වූ අනන්‍යතාවයන් හා ආකල්පීය වෙනස්කම් මත පුද්ගලයින් හෝ පුද්ගල කණ්ඩායම් අතර ඇතිවන ප්‍රතිවිරෝධතාවයන් ගැටුමක් ලෙස හැඳින්විය හැකිය."

**[Jems A . Schellenberg]**

"එකිනෙකට පරස්පර අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමේ දී නිදහස් පුද්ගලයන් අතර සිදුවන අන්තර් ක්‍රියාකාරීත්වයන් ගැටුම ලෙස හැඳින්විය හැකිය."

**[ I.L. Hocker and W.W. Wilmot ]**

"ප්‍රචණ්ඩ හැප්පීම් , අරගලයක් හෝ හරඹයක් , මානසික වශයෙන් සිදුවන අරගලයක් ගැටුමක් ලෙස හැඳින්විය හැකිය."

**[ The Webster English Dictionary ]**

"පුද්ගල කණ්ඩායම් හෝ රාජ්‍යයන් බරපතල නොඑකඟතාවන්ට හෝ විවාදයට සම්බන්ධව සිටින තත්ත්වයක දී ගැටුම් පැන නගී."

**[ The Oxford Dictionary ]**

"එකිනෙකට නොගැලපෙන අරමුණු සහිත පුද්ගලයන් දෙදෙනෙක් හෝ ඊට වැඩි ගණනක් හෝ කණ්ඩායමක් එම විශ්වාසයන් ප්‍රකාශ කරන විට සමාජ ගැටුම් පැන නගී"

**[ Louic Kriesbury ]**

- <u>ගැටුම්වලට අදාළ ඓතිහාසික විකාශනය</u>

ගැටුම යන සමාජ ප්‍රපංචය දීර්ග ඓතිහාසික පදනමක් සහිත සංකල්පයකි. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් ගැටුම මානව ඉතිහාසයේ ආරම්භයේ සිට උත්පාද වූවකි. **සටන්කාමීන් භූමිය අත්පත් කර ගැනීමට - සම්පත් වර්ධනය කර ගැනීමට - ස්වකීය බලය ස්ථාපනය කර ගැනීමට ගැටුම් ඇති කර තිබුණි.**

15, 16, 17 සියවස් නූතන අවධිය වන විට පුනරුදයේ - කාර්මීකරණයේ ප්‍රතිඵලයක් ලෙස ගැටුම නව අධියරකට පැමිණ තිබුණි. 1688 ඉංග්‍රීසි විප්ලවය ඒ අතර ප්‍රධාන වේ. පසුව යුරෝපා කේන්ද්‍රය , ස්පාඤ්ඤය , පෘතුගාලය ඉංග්‍රීසි ජාතිකයන් විසින් ආසියානු , අප්‍රිකානු , ලතින් ඇමරිකානු භූගෝලීය සීමාවන් ස්වකීය ග්‍රහණයට නතු කර ගැනීම සම්බන්ධයෙන් තරඟය ආරම්භකර තිබුණි.

18 , 19 වැනි සියවස් වන විට ගැටුම යන සමාජ ප්‍රපංචය පුළුල් දේශපාලන ඒකක වසා පැතිර ගියේ ය. රාජ්‍යය මට්ටමින් යුද්ධ දක්නට ලැබුණි. I ලෝක මහා සංග්‍රාමය (1914 - 1918) - II ලෝක මහා සංග්‍රාමය (1939 - 1945) - ක්‍රිමියානු යුද්ධය - ඇමරිකානු විප්ලවය - ප්‍රංශ විප්ලවය - රුසියානු විප්ලවය ශක්තිමත් නිදසුන් වේ.

1945 දෙවන ලෝක මහා සංග්‍රමයට පශ්චාත් කාලීන අවධිය තුළ ආසියානු - අප්‍රිකානු - ලතින් ඇමරිකානු කලාප තුළ යටත් විජිත කරණයට විරුද්ධව නිදහස් අරගල ආරම්භ විය. ඒ තුලින් ද ගැටුම බොහෝ දුරට ව්‍යාප්ත විය. 1960 වන විට ජාතික රාජ්‍ය තුළින් ජනවාර්ගික අර්බුද පැන නැගුණි.

- **ගැටුම් ත්‍රිකෝණය.**

හාවඩ් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ජොහාන් ගැල්ටුං (Johan Galtung) විසින් ගැටුම් ත්‍රිකෝණය සම්බන්ධ අදහස ඉදිරිපත් කළේ ය. (1969) එමගින් ගැටුමක් තුළින් විද්‍යමාන වන්නා වූ එකිනෙකට සම්බන්ධ ව්‍යූහ - ආකල්ප - චර්යාවන් සම්බන්ධයෙන් අධ්‍යයනය කරයි.




1. සංදර්භය (ව්‍යූහය) - **Context**

ව්‍යූහය යනු ගැටුමට මූල්වන (පසුබිම්වන) තත්වයන් ය. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් ගැටුම් හා සම්බන්ධ විෂය මූලික සාධකයන් ය. මෙම විෂය මූලික සාධක සමාජ වටිනාකම් හා සමාජ ව්‍යූහයේ නොමනා ගැලපීම් නිසා ඇති වන බව රොබට් මිචෙල් පැහැදිලි කරයි. මේ අනුව විවිධ පාර්ශවයන් (කණ්ඩායම්) අතර අසමානුපාතික අවශ්‍යතා - අසමානුපාතික සාරධර්ම - අසමානුපාතික ඉලක්ක ඇති වූ විට ගැටුම් නිර්මාණය වන බව ප්‍රකාශ වේ. එම අසමානුපාතික අවශ්‍යතා සාරධර්ම , ඉලක්ක මගින් ගැටුමක් නිර්මාණය වීමට අවශ්‍ය විෂය මූලික හෙවත් සමාජ ආර්ථික වාතාවරණය නිර්මාණය කරයි.

නිදර්ශන -: පිලෝපීනිසියානු යුද්ධයට (Peloponnesian war) පෙර ග්‍රීක නගර රාජ්‍යය අතර තරගකාරී කණ්ඩායම් ඇති වීම. මෙම කණ්ඩායම් අතර පැවති අන්‍යෝන්‍යය තරගය මගින් සමමිතික ගැටුම් ව්‍යූහයක් සංස්ථාපනය කිරීම.

2. ආකල්ප - **Attitude**

ගැටුම පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී ආකල්ප සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම අතිශය වැදගත් වේ. ආකල්ප යනු ගැටුම නිර්මාණය කරනු ලබන මනෝවිද්‍යාත්මක සාධකයන් හා එහි ක්‍රියාදාමය යි. එම මනෝමූලික සාධක අතර, අපේක්ෂාභංගත්වය - නොරිස්සුම හා වෛරය - බිය - සංශය කේන්ද්‍ර වේ. මෙම මනෝ මූලික සාධයන් උත්පාද වීම සඳහා විරුද්ධ පාර්ශවයන් එකිනෙකා සම්බන්ධව ඇති කර ගන්නා ප්‍රතිවිරුද්ධ හැඟීම් - සතුරු ප්‍රතිරූප බලපානු ලැබේ.

3. චර්යාවන් - **Behavior**

<u>ගැටුමට අදාළ කණ්ඩායම් විසින් එකිනෙකාට අනතුරු කරගන්නා විට ගැටුම් චර්යාවන් ප්‍රකට වේ.</u> මීට අදාළ නිදර්ශන ලෙස බිය ගැන්වීම - බලහත්කාරය - විනාශකාරී ප්‍රහාර දැක්විය හැකිය. මේ අනුව ගැටුමක්,

- අසමානුපාතික ඉලක්ක
- නිශේධනාත්මක ආකල්ප
- විනාශකාරී චර්යාවන් තුලින් උත්පාද විය හැක.

- **ගැටුම් ත්‍රිකෝණය තුළ ඇති වැදගත්කම්.**

(i) විශේෂිත වූ ගැටුම් අවස්ථාවන් විභාග කිරීමට හා විමර්ශනය කිරීමට හැකි වීම.

(ii) ගැටුම් හා සම්බන්ධ පාර්ශවයන් ගේ ආකල්ප හා දැනුම පිළිබඳ තත්වයන් විභාග කිරීමට හැකි වීම.

(iii) ගැටුම් ක්‍රියාවලිය තුළ චර්යාත්මක ක්‍රියාශීලීත්වය සම්බන්ධයෙන් අවබෝධ කොටගත හැකි වීම.

- <u>ගැටුම් ඇතිවීමට බලපාන සාධක (ගැටුම් මූලාශ්‍ර).</u>

ගැටුම් සම්බන්ධ සංවාදය තුළ දී ගැටුම් මූලාශ්‍ර හෙවත් ගැටුම් ඇතිවීමට බලපාන සාධක සම්බන්ධයෙන් සටහන් තැබීම වැදගත් වේ. විශේෂයෙන් ගැටුම් නිරාකරණය කිරීමේ දී ගැටුම් මූලාශ්‍ර සම්බන්ධ අවබෝධය අතිශයින් වැදගත් වේ.

- **අභ්‍යන්තර ගැටුම් පිළිබඳ මූලාශ්‍ර 04 කි.**

1. ව්‍යූහාත්මක සාධක
2. දේශපාලන සාධක
3. ආර්ථික හා සමාජ සාධක
4. සංස්කෘතික සාධක

01. <u>ව්‍යූහාත්මක සාධක</u>

දුර්වල රාජ්‍යයන් - රාජ්‍ය අභ්‍යන්තර ආරක්ෂක ප්‍රශ්න - වාර්ගික භූගෝලීය පදනම ව්‍යූහාත්මක සාධක අතර ප්‍රධාන වේ.

දුර්වල රාජ්‍යය,

අභ්‍යන්තර ගැටුම් ඇති වීමට බලපාන ප්‍රධාන ව්‍යූහාත්මක සාධකයකි මෙය. II වන ලෝක මහා සංග්‍රාමයට පසුව බිහිවන නව රාජ්‍යයන් දුබලව බිහි වී තිබේ.

නව රාජ්‍යයන්හි ලක්ෂණ.

I. ආර්ථික අතින් නොපොහොසත් වීම (දුර්වල වීම.)
II. දේශපාලන වශයෙන් නවීකරණය නොවීම.
III. සමාජයතුළ බහුවිධ තාවක් පැවතීම.

<u>යටත් විජිත පාලන ක්‍රම විසින් අප්‍රිකානු මහද්වීපයේ</u> බොහෝ රාජ්‍යයන් අසම්භාවිතාව බිහි කොට තිබීම නිදර්ශන ලෙස දැක්විය හැකිය. (සෝමාලියාව - උගන්ඩාව - මොරොක්කෝව - නයිජීරියාව - රොඩේෂියාව - කෙන්නියාව - ගානාව) එම අප්‍රිකානු රාජ්‍යයන් තුළ දේශසීමා අර්බුධ , දේශපාලන නීත්‍යානුකූල භාවය සම්බන්ධ ප්‍රශ්න , අර්ථාන්විත පාලනයක් ගෙන යාමට නොහැකි වීම, දේශපාලන ව්‍යුහයක් නොමැති වීම යන අර්බුධයන්ට මුහුණපා තිබේ. මීට සාම්‍ය වූ ගැටළු වලට **<u>සෝවියට් සමූහාණ්ඩුව හා යුගොස්ලොවැකියානු පාලනය</u>** බිඳවැටීමෙන් පසුව බිහි වූ බොහෝ රාජ්‍යයන්ට ද මුහුණදීමට සිදුවිය.

**ඇතැම් රාජ්‍යයන් දුර්වල වීම කෙරෙහි බලපෑ හේතු**

- **ලෝක බලවතුන් හා අන්තර්ජාතික මූල්‍ය ආයතන විසින් ලබා දෙන විදේශ ආධාර අවම කිරීම.**
- **අන්තර් ජාතික වෙළඳ පොළ තුල දේශීය නිෂ්පාදිත භාණ්ඩයන්ගේ මිළ පහළ වැටීම.**
- **වංචාව , දූෂණය අකාර්‍යක්ෂමතාවය හා ආර්ථික අසංවර්ධිත භාවය.**

මෙලෙස රාජ්‍යය අභ්‍යන්තර ව්‍යුහය දුර්වල අසංවර්ධිත ස්වභාවයක් ඇති වීම ප්‍රචණ්ඩකාරී ගැටුම් වර්ධනය වීමට හේතු වේ. රාජ්‍යය දුබලවන විට ආණ්ඩු පක්ෂය හා විරුද්ධ පක්ෂය අතර බල අරගලය ද උත්සන්න වේ. එවිට මධ්‍ය ආණ්ඩුවේ පීඩනයට ලක්ව සිටින වාර්ගික කොටස් පරිපාලන ස්වාධිනතාවක් හෝ ස්වාධීන රාජ්‍යයක් නිර්මාණය කර ගැනීමටපෙළඹීම.

**ජනවාර්ගිකත්වය,**

ජනවාර්ගිකත්වය අභ්‍යන්තර ගැටුම් ඇතිවීමට හේතු විය හැකි ව්‍යුහාත්මක සාධකයකි. වර්තමානය තුළ ජාතික රාජ්‍ය දෙසිය ගණනාව අතුරින් **<u>සජාතිය රාජ්‍යයන් පවතින්නේ 20 කටත් වඩා</u>** අඩු ගණනකි. ඒ අතර **<u>ජපානය - උතුරු කොරියාව - දකුණු කොරියාව - ස්වීඩනය - නොර්වේ රාජ්‍යයන් ප්‍රධාන වේ</u>**. සජාතීය රාජ්‍යයන් තුළ වාර්ගික ගැටුම් ඇති නොවේ. නමුත් සජාතීය භාවය පමණක් අභ්‍යන්තර ජාතික ආරක්ෂාව පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් නොවේ. <u>නිදර්ශන</u> ලෙස දක්වන්නේ නම් අප්‍රිකානු කලාපයේ **සෝමාලියානු රාජ්‍යය සජාතීය රාජ්‍යයකි. නමුත් ඒ තුළ ගෝත්‍රික යුද්ධ - ප්‍රාදේශීය බල අරගල වලින් ගහණ වේ.**

ජනවාර්ගිකත්වය අභ්‍යන්තර ගැටුම් ඇති වීමට බලපාන මූලික සාධකයකි. විශේෂයෙන් **තෙවන ලෝකයේ රාජ්‍යයන්හි** සමාජය බහුවාර්ගික ස්වරූපයක් ගනී. එම නිසා එවැනි රාජ්‍ය තුළ ජනවාර්ගිකත්වය ගැටුම් බිහිවීමට අදාළ ප්‍රධාන මූලාශ්‍රයන් වේ.

02. <u>දේශපාලන සාධක.</u>

අභ්‍යන්තර ගැටුම් ඇතිවීම සඳහා දේශපාලන ආයතන තුළ සිදුවන වෙනස්කම් - ජාතික මතවාද නොසලකා හැරීම් - අන්තර් කණ්ඩායම් - දේශපාලන ප්‍රභූන් වැනි දේශපාලන සාධක හේතු වේ.

**වෙනස්කම් කරනු ලබන දේශපාලන ආයතන ,**

දේශපාලන ක්‍රමය සහ එමගින් ඉටුවන සාධාරණත්වයේ ප්‍රමාණය ගැටුම් ඇති කිරීම කෙරෙහි බලපායි. අධිකාරී දේශපාලන ක්‍රියාවලියක් තුළ එක් ජනවර්ගයක අවශ්‍යතා - වුවමනාවන් පමණක් ඉටු කරමින් අන් ජන වර්ග නොසලකා හරින විට ගැටුම් උත්පාද වීමේ ප්‍රවනතාවය වැඩි වේ. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ක්‍රියාත්මක වුවද ආණ්ඩුවේ , පොලීසියෙහි , අධිකරණයෙහි , සිවිල් සේවයෙහි දේශපාලන ක්ෂේත්‍රයන්හි සහ අනිකුත් දේශපාලන ආයතනයන්හි සියලුම ජනවර් නියෝජනය නොවන විට ගැටුම් ඇති විය හැකිය.

**ජාතික මතවාදයන්ගේ ස්වභාවය ,**

රාජ්‍යයන් තුළ ක්‍රියාත්මක වන ජාතික මතවාදයේ ස්වභාවය මත ද ගැටුම් උත්පාද විය හැකිය. ජාතික මතවාදය වාර්ගික පදනමක් මත ගොඩනගා ඇති විට රාජ්‍යය තුළ ගැටුම් ඇති විය හැකිය. මෙම තත්වයට **නිදර්ශන** ලෙස <u>බෝල්කන් රාජ්‍යයන් - සංවර්ධනය වෙමින් පවතින රටවල් දැක්විය හැකිය</u>.

**දේශපාලන ප්‍රභූන් ,**

අභ්‍යන්තර ගැටුම් ඇතිවීමට බලපාන දේශපාලන මූලාශ්‍රයක් ලෙස දේශපාලන ප්‍රභූන් දැක්විය හැකිය.විශේෂයෙන් ආර්ථික , දේශපාලන හෝ සමාජමය අර්බුධයන් පවතින විට එය නිරාකරණය කිරීම සඳහා දේශපාලන ප්‍රභූන් භාවිතා කරන උපාය මාර්ග මෙහි දී වැදගත් වේ. එවැනි සමාජ , ආර්ථික , දේශපාලන අර්බුද නිරාකරණය කිරීම සඳහා පාලක ප්‍රභූ පන්තිය ජනවාර්ගික අරගලයක් උත්සන්න කළ හැකිය. එවිට ගැටුම උත්පාද වේ.

03. <u>ආර්ථික හා සාමාජයීය සාධක.</u>

ගැටුම් උත්සන්න වීමට ආර්ථික හා සාමාජයීය සාධක හේතු වේ. ආර්ථික ගැටළු - වෙනස්කම් සිදු කරන ආර්ථික ක්‍රියාවලින් - ආර්ථික සංවර්ධනයෙහි අත්හදා බැලීම්වල විපාක හා නවීකරණය ඒ අතර ප්‍රධාන වේ.

**ආර්ථික ගැටළු ,**

රාජ්‍යයන් තුළ විවිධාකරයේ ආර්ථික ගැටළු අර්බුද පවතී. එම ආර්ථික ගැටළු මත රාජ්‍යයන් තුළ කැලඹීම් සහගත තත්වයන් ඇතිව තිබේ. පැරණි සෝවියට් දේශය මෙන්ම ඇතැම් අප්‍රිකානු රාජ්‍යයන් ද සැලසුම් සහගත ආර්ථිකයේ සිට වෙළෙඳපොල මත පදනම් වූ ආර්ථික ක්‍රියාවලියට පරිවර්ථනය වීමේ දී ආර්ථික ගැටළු උත්සන්නව තිබේ. සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයන් තුළ විරැකියාව - උද්ධමනය - ඉඩම් සඳහා වූ තරගය වැනි ආර්ථික ගැටළු රාශියකි.

**වෙනස්කම් සිදුකරන ආර්ථික ක්‍රියාවලි ,**

සමාජමය වශයෙන් එක් පංතියකට හෝ එක් ජනවර්ගයකට විශේෂීකරණය වූ ආර්ථික ක්‍රියාවලියක් තුලින් ප්‍රචණ්ඩත්වය බිහි කරයි. තරහ උත්දීපනය කරයි. අපේක්ෂා භංගත්වය උත්පාදනය කරයි. මීට අදාළව **අසමානුපාතික ආර්ථික අයිතිවාසිකම් - අසමානුපාතික ආර්ථික අවස්ථාවන් - අසමානුපාතික ආර්ථික නිදහසක් - ඉඩම් සහ සම්පත් සම්බන්ධයෙන් අසමානුපාතික ප්‍රවේශ** ආදිය දැක්විය හැකිය. මෙවැනි තත්වයන් තුළ රාජ්‍යය අභ්‍යන්තරය තුළ ගැටුම් උත්පාද විය හැකිය.

**නවීකරණය ,**

නවීකරණය පිළිබඳ සිද්ධාන්තය ද ගැටුම් ඇතිවීම සඳහා බලපාන ආර්ථික හා සාමාජයීය සාධකයකි. **කාර්මීකරණය - නව තාක්ෂණය** හඳුන්වාදීම මගින් සමාජය තුළ වෙනස්කම් සිදුවේ. **සංක්‍රමණ හා නාගරීකරණය** මගින් එම වෙනස්කම් තවදුරටත් තීව්‍ර කරයි. එහි ප්‍රතිඵලය වන්නේ සමාජ , ආර්ථික , දේශපාලනික , ආගමික , සංස්කෘතික කරුණු සම්බන්ධයෙන් නව හැඟීම් පහළ වීමයි. එවිට සාම්ප්‍රදායික මතවාද හා නව මතවාද අතර ගැටුමක් සිදුවේ. අනෙක් පසින් නව සමාජ, ආර්ථික , දේශපාලනික , සංස්කෘතික ගැටීම් වලට වර්ධනය නොවූ දේශපාලන ආයතනයන් , මතවාදයන් බාධාවක් ලෙස මතු වීමයි. එවැනි තත්වයක් තුළ ගැටුම් උත්පාද වේ. **<u>නිදර්ශන</u>** ලෙස **උත්කෘෂ්ට විප්ලවය - 1776 - ඇමරිකානු විප්ලවය - ප්‍රංශ විප්ලවය - රුසියානු විප්ලවය** දැක්විය හැකිය.

04. **<u>සංස්කෘතික සාධක ,</u>**

අභ්‍යන්තර ගැටුම් ඇතිවීම සඳහා බලපාන ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස සංස්කෘතික සාධක දැක්විය හැකිය. **සුළුතරය හා සම්බන්ධ සංස්කෘතික වෙනස්කම් - ජනවාර්ගික කණ්ඩායම් අතර පවතින වැරදි අවබෝධය** ඊට අදාළ ප්‍රධාන කරුණු ලෙස විග්‍රහ කළ හැකිය.

**සුළු ජාතිය හා සම්බන්ධ සංස්කෘතික වෙනස්කම්,**

අසමාන වූ අධ්‍යාපන අවස්ථා - සුළු ජාතික භාෂාවන්හි වලංගු භාවය සම්බන්ධ ප්‍රශ්න - සුළු ජාතික ආගම් වලට ඇති නිදහස සම්බන්ධ ප්‍රශ්න - සුළු ජාතින් හා සම්බන්ධ සංස්කෘතික වෙනස්කම් ලෙස හැඳින්විය හැකිය. මෙමගින් උත්සාහ ගෙන ඇත්තේ සුළු වාර්ගික කණ්ඩායම් මහා සංස්කෘතියට අවශෝෂණය කර ගැනීමයි. **<u>නිදර්ශන</u>** ලෙස **සෝවියට් සමූහාණ්ඩුව තුළ ජෝසප් ස්ටාර්ලිස් අනුගමනය කළ ප්‍රතිපත්ති - ප්‍රංශය විසින් තුර්කි ජාතිකයන් සම්බන්ධයෙන් අනුගමනය කළ ප්‍රතිපත්ති - තායිලන්තය විසින් උතුරු හා බටහිර කඳුකර ගෝත්‍ර සම්බන්ධයෙන් අනුගමනය කළ ප්‍රතිපත්ති - ඉරාණය විසින් කර්දි ජාතිකයන් සම්බන්ධයෙන් අනුගමනය කළ ප්‍රතිපත්ති** ආදිය දැක්විය හැකිය.

**ජනවාර්ගික කණ්ඩායම් අතර ඇති වැරදි අවබෝධය ,**

අභ්‍යන්තර ගැටුම් ඇති වීම සඳහා ජනවාර්ගික කණ්ඩායම් අතර ඇති වැරදි අවබෝධය හා මනෝභාවයන් ද හේතු වේ. ජනවාර්ගික කොටස් අතර ඇති වෛරය - ද්වේෂය බොහෝවිට ඓතිහාසික තොරතුරු සාධක මූලාශ්‍ර මාර්ගයෙන් යුක්ති සහගත කොට තිබීම. **නිදර්ශන ලෙස බොස්නියාවේ ෂර්බි ජාතිකයන් තමන් යුරෝපය ආරක්ෂා කරන වීරෝධාර ජාතිකයන් බව විශ්වාස කිරීම. කෝෂියන්වරු ෆැසිස්ට්වාදීන් ලෙස හැඳින්වීම.**

(**N.B**) *වර්තමානයේ පවතින ගැටුම් අතරින් බොහෝමයක් වාර්ගිකත්වය – භාෂාව – ඉතිහාසය – වර්ණය – කුලය – ආගම – අයිතිවාසිකම් යන කරුණු මූලාශ්‍ර කොටගෙන උත්පාද වී තිබේ. මෙවැනි සාධක මත උත්පාද වූ ගැටුම් රාජ්‍යය අභ්‍යන්තර ගැටුම් ලෙස නිර්වචනය කරනු ලබයි. එඩ්වඩ් අසාර්* (Edward Azar) *ට අනුව දිගගැස්සුණු සමාජගැටුම් වල අභ්‍යන්තර ප්‍රතිඵලය ජාතික මට්ටමේ සිට ජාත්‍යන්තර මට්ටම දක්වා විසිරගොස් තිබේ.*

- **මූලික වශයෙන් ගැටුම් ඇතිවීමට බලපාන සාධක කිහිපයකි.**

1. සාධක - ඓතිහාසික පිළිගැනීම් අතීත හා වර්තමාන කොන්දේසි යනාදිය පිළිබඳ තත්ත්වයන්.
2. අවශ්‍යතා හා ආශාවන් - ආරක්ෂාව සහ ගරුත්වය සම්බන්ධයෙන් ඇතිවන අවශ්‍යතාව පිළිබඳ හැඟීම.
3. ඇගයුම - දිගුකාලීන විශ්වාස හා උපකල්පන.
4. තත්වයන් - විශේෂිත අවශ්‍යතාවයන් සහ ආශාවන් ඉටුකර ගැනීමට හැකි හොඳම ක්‍රමය ලෙස සැලකීම.
5. ක්‍රමයන් - අරමුණු ලබා ගැනීම සඳහා ජනතාව අනුගමනය කරනු ලබන ක්‍රමයක් වීම.
6. සන්නිවේදනය බිඳවැටීම - ඒ ඒ ජනතාවන් හෝ පාර්ෂව අතර ඇති සන්නිවේදනය බිඳ වැටීම.
7. අධිකාරී බලය හා සම්පත් සඳහා ඇති තරගය - බලය හා ස්වාභාවික විශේෂයෙන් ස්වාභාවික සම්පත් සඳහා ඇති අරගලය.

- <u>ගැටුම් වල ලක්ෂණ.</u>

(i) **පුද්ගලයන් දෙදෙනෙකු හෝ පාර්ෂවයන් දෙකක් හෝ කිහිපයක් අතර ඇතිවන නොඑකඟතාවය හෙවත් නොගැළපීම.**

(ii) **ඒ ඒ පාර්ශවයන් හෝ කණ්ඩායම් ප්‍රතිවිරුද්ධ ක්‍රියාමාර්ගවල නිතර වීම.**

(iii) **ප්‍රතිවරුද්ධ පාර්ෂවයන්ට අලාභහානි කිරීම විනාශ කිරීම අරමුණු කොට ගෙන පැවතීම.**

(iv) **ගැටුම්වල සාධනීය ලක්ෂණ මෙන්ම ප්‍රතිශේධනීය ලක්ෂණ පවතී.**

(v) **ගැටුම්වල ස්වභාවය අනුව නිර්මාණාතාමක හෝ විනාශකාරී විය හැකිය.**

- <u>ගැටුමක අවස්ථා.</u>

ගැටුම් සම්බන්ධ සංවාදය තුළ දී ගැටුමක අවස්ථා සම්බන්ධයෙන් ද අවධානය යොමු කිරීම වැදගත් වේ. ඇතැම් විචරකයින් **ගැටුම චක්‍රයක් ලෙස විග්‍රහ කරයි. ඇතැමුන් ගැටුම ඉහළ පහළ යන ක්‍රියාවලියක් ලෙස දකිති.** <u>ගැටුමක අවස්ථා සරල බවේ සිට සංකීර්ණත්වය දක්වා පහත ආකාරයට පෙළගැස්විය හැකිය</u>.

1. **අවිචාරවත් අවස්ථාව.**

පුද්ගලයන් , පාර්ෂවයන් හෝ කණ්ඩායම් තමන් ඉතා නිවැරදි බව එකිනෙකා කේවලව කල්පනා කිරීම .එමෙන්ම එකිනෙකා පිළිබඳව විචාරවත් හා තුලනාත්මක අවබෝධයක් නොවීම අවිචාරවත් අවස්ථාව ලෙස හැඳින්විය හැකිය. <u>මෙම අවිචාරවත් අවස්ථාව එකතු වීම සාකච්ඡා කිරීම මගින් විසඳීමට හැකිය.</u>

2. **බෙදීම් අවස්ථාව.**

අවිචාරවත් අවස්ථාව තව දුරටත් වර්ධනය වීම මගින් කණ්ඩායම් වශයෙන් බෙදී ඇඩි ලෙස භේද භින්න වී කිසි දිනක එක් විය නොහැකි යැයි යන හැඟීම් මත ක්‍රියාත්මක වන අවස්ථාව බෙදීමේ අවස්ථාව ලෙස හැඳින්විය හැකිය. <u>මෙවැනි තත්වයක් දෙපාර්ශවය සමගිකරවීම මගින් විසඳිය හැකිය</u>.

3. **අන්‍යෝන්‍යය දුක්ගැනවිලි ප්‍රකාශ වන අවස්ථාව.**

මෙහි දී ස්වකීය හැකියා , දක්ෂතා, සංඛ්‍යාත්මක ප්‍රමාණය වාසි හා අවාසි සහගත තත්ත්වයන් ප්‍රකාශ කරයි. <u>මැදිහත් කරුවකු මගින් වාසි හෝ අවාසි සලකා ඉදිරිපත් කළ හැකිය</u>.

4. ධ්‍රැවාන්තකරණය හා සන්නද්ධකරණ අවස්ථාව.

පීඩනයට පත්වූ පිරිස බෙදී ධ්‍රැවාන්තකරණය වේ. එම ධ්‍රැවාන්තකරණය වූ පිරිස සන්නද්ධ වීමට පටන් ගනී. එම සන්නද්ධ කරණය මගින් එක්වර ප්‍රචණ්ඩත්වය ඉස්මතු නොවුන ද මෙම තත්වය කාලයක් පැවතීම ප්‍රචණ්ඩකාරී ගැටුම් තත්වයක් ස්මතු විය හැකිය.

5. ප්‍රචණ්ඩ ගැටුම් අවස්ථාව.

ප්‍රචණ්ඩකාරී අවස්ථාවේදී ස්වකීය පැවැත්ම තහවුරු වන්නේ අනෙකා විනාශ කිරීමෙන්ය. යන හැඟීම ප්‍රතිපක්ෂ කණ්ඩායම් සිතයි. එම නිසා පහරදීම - පලවා හැරීමට ක්‍රියා කරයි. තම ජයග්‍රහණය සටන්කාමීව අත්පත් කර ගැනීමට කටයුතු කරයි.

## • ගැටුම් වර්ගීකරණය.

ගැටම් සම්බන්ධයෙන් වර්ගීකරණ රාශියක් ඉදිරිපත් වී තිබේ. විවිධ නිර්නායකයන් භාවිතා කරමින් ගැටුමේ විවිධ ආකාරයට වර්ගකොට තිබේ.

- **ගැටුම් ආශාවන් අනුව ආකාර තුනකට වර්ග කළ හැකිය.**

I. ආශාවන් පිළිබඳ ගැටුම්. (අවශ්‍යතා හා අයිතීන් පිළිබඳ ගැටුම්)

II. ඇගයුම් පිළිබඳ ගැටුම්.

III. සම්බන්ධතාව පිළිබඳ ඇගයුම්

**01. ආශාවන් පිළිබඳ ගැටුම් (අවශ්‍යතාවයන් හා අයිතීන් සම්බන්ධ ගැටුම්)**

ආශාවන් හා අයිතීන් පිළිබඳ ගැටුම් යනු භූමිය හෝ සම්පත් මත පදනම් වී උත්පාදවන ගැටුම් ය. මෙම ගැටුම් අවශ්‍යතා හා අයිතීන් පිළිබඳ ගැටුම් ලෙස ද හඳුන්වයි. මෙම ගැටුම් වල ස්වභාවය ආශාවේ හා අයිතින්ගේ ස්වභාවය මත තීරණය වේ.

**නිදර්ශන -:** එතරම් වැදගත් භූමියක් නොවේ නම් ගැටුම සාමකාමීව විසඳේ. එහිලා නිදර්ශන ලෙස ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර කච්චතිව් දූපත සම්බන්ධව පැවති ප්‍රශ්නය ගැටුමකින් තොරව සාමකාමීව විසඳා ගැනීම. 1946 දී ඉන්දියානු අගමැති ලාල් බහදූර් ශාස්ත්‍රී හා ශ්‍රී ලංකා අගමැති සිරිමාවෝ මැතිණිය අතර පැවති සාකච්ඡාවේ ප්‍රතිඵලයක් ලෙස කච්චතිව් දූපතේ අයිතිය ලංකාවට හිමි විය.

නමුත් ජාතික ආරක්ෂාවට රාජ්‍ය ආරක්ෂාවය වැදගත් භූමියක් පදනම් කොටගෙන ඇතිවන ගැටුම් ඉතා උග්‍ර වේ. නිදර්ශන ලෙස ඉන්දියාව - චීනය, ඉන්දියාව - පකිස්ථානය , ඉන්දියාව - ඉරාක ගැටුම් දැක්විය හැකිය.

(**N.B**) *මෙවැනි ගැටුම් නිරාකරණය කිරීම තරමක් පහසුය. ඊට හේතු වන්නේ ගැටුම සිදුවන පාර්ශව අතර ඊට අදාළ හේතු සම්බන්ධයෙන් පොදු ඒකාගතාවයක් පැවතීමයි. එසේම මෙවැනි ගැටුම් විසඳීමට අනුගමනය කළ හැකි පොදු ක්‍රියාවලියක් අන්තර්ජාතික දේශපාලනය තුළ පවතී.*

## 02. ඇගයුම් පිළිබඳ ගැටුම් (සාරධර්ම හා සම්බ්ධිත ගැටුම්)

<u>ආගම - දේශපාලන මතවාද - ජනවාර්ගිකත්වය මත උත්පාද වන ගැටුම් ඇගයුම් පිළිබඳ ගැටුම් හෙවත් සාරධර්ම පිළිබඳ ගැටුම් ලෙස නිර්වචනය කළ හැකිය</u>.

(**N.B**) *මෙවැනි ගැටුම් නිරාකරණය කිරීම දුෂ්කරය. ඊට ප්‍රධානතම හේතුව වන්නේ ගැටුමට අදාළ පාර්ශවයන් අතර ගැටුම සම්බන්ධයෙන් ස්වකීය සාරධර්ම (විශ්වාස පද්ධතීන්) සම්බන්ධයෙන් සම්මුතීන්ට එළඹීමට අකමැති වීමයි.*

## 03. සම්බන්ධතා පිළිබඳ ගැටුම්

සම්බන්ධතා පිළිබඳ ගැටුම් යනු <u>යටත් විජිත පාලකයන් හා යටත් විජිත වැසියන් අතර, සුළුතරය හා බහුතරය අතර පාලක පන්තිය හා පාලිත පංතිය අතර සිදුවන ගැටුම්ය.</u> මෙවැනි ගැටුමකට <u>නිදර්ශන</u> ලෙස <u>බ්‍රිතාන්‍යය සහ ආර්ජන්ටිනාව අතර 'පෝක්ලන්ඩ්' දූපත සම්බන්ධව පැවති ගැටුම දැක්විය හැකිය</u>. පෝක්ලන්ඩ් දිවයින බ්‍රිතාන්‍යයන්ට ද ආර්ජන්ටිනාවට ද එතරම් වැදගත් භූමියක් නොවේ. මෙම ගැටුම විචාරකයින් හඳුන්වා ඇත්තේ <u>හිසකෙස් නොමැති පුද්ගලයන් දෙදෙනෙක් පනාවකට කරන අරගලයක් ලෙස</u> ය.

(**N.B**) *ඉහත ආකාරයට ආශාවන් පිළිබඳ ගැටුම් – ඇගයුම් පිළිබඳ ගැටුම් – සම්බන්ධතා පිළිබඳ ගැටුම් ලෙස වෙන වෙනම වර්ග කළ හැකි මුත් ඇතැම් විට මෙම සාධකයන් එකවිට බලපාමින් වුවද ගැටුම් නිර්මාණය විය හැකිය.*

□ ගැටුම සිදුවන පාර්ෂව මත පදනම් වෙමින් ද ගැටුම් ආකාර දෙකකට වර්ග කළ හැකිය.

I. සම්මිතීය ගැටුම් (Symmetric Conflict)

II. අසම්මිතීය ගැටුම් (Asymmetric Conflict)

## 1. සම්මිතීය ගැටුම්.

සමමිතීය ගැටුම් යනු <u>සමාන පුද්ගලයන් හෝ සමාන පාර්ෂවයන් සමාන රාජ්‍යයන් අතර ඇතිවන ගැටුම්ය</u>. මෙම ගැටුම් වලට <u>නිදර්ශන</u> ලෙස ස්වාමි පුරුෂයා සහ භාර්යාව අතර ඇතිවන ගැටුම් - ඇමරිකාව මා රුසියාව අතර පවතින ගැටුම් , ඊශ්‍රායලය - මැදපෙරදිග රටවල් අතර පවතින ගැටුම්.

## 2. අසම්මිතීය ගැටුම්.

අසමමිතීය ගැටුම් යනු, **අසමාන පුද්ගලයන් හෝ අසමාන පාර්ෂව , අසමාන රාජ්‍යයන් අතර ඇතිවන ගැටුම් ය**. අසම්මිතීය ගැටුම් වලට **නිදර්ශන** ලෙස **සුළු ජාතීන් හා බහු ජනවර්ග අතර ඇතිවන ගැටුම්, උතුරු වියට්නාමය හා ඇමරිකාව අතර ඇති වූ ගැටුම , ඇමරිකානුවන් හා බ්‍රිතාන්‍යය - ඉරාකයට විරුද්ධව සිදුකළ යුද්ධය , රාජ්‍යයන් තුළ ඇතිවන කැරළි , විප්ලව ද** මීට අදාළ වේ.

▫ **මිනිසා අතර සිදුවන ගැටුම් ප්‍රධාන ස්ථර තුනක් යටතේ හඳුනාගත හැකිය.**

I. ගෘහස්ථ ගැටුම් (Domestic Conflict)

II. රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් (Intra - State Conflict)

III. අන්තර් රාජ්‍යය ගැටුම් (Inter - State Conflict)

## 1. ගෘහස්ථ ගැටුම්.

ගෘහ කුටුම්භය තුළ මව , පියා , දරුවන් අතර ඇතිවන ගැටුම් ගෘහස්ථ ගැටුම් ලෙස සරලව නිර්වචනය කළ හැක.

## 2. රාජ්‍යය අභ්‍යන්තර ගැටුම්.

රාජ්‍යය අභ්‍යන්තර ගැයුම් යනු, **ජාතික රාජ්‍යය තුළ සිදුවන ගැටුම් ලෙස සරලව හැඳින්විය හැකිය.** මෙම ගැටුම් බොහෝමයක් වාර්ගික - ආගම - භාෂාව - ඉතිහාසය - අයිතිවාසිකම් ආදිය මත පදනම් වී උත්පාද වේ. නූතන ජාතික රාජ්‍යයන් විශාල ප්‍රමාණයක් විජාතීය (බහුවාර්ගික - බහුවාර්ණික - බහු ආගමික - බහු සංස්කෘතික - බහු භාෂාමය) රාජ්‍යයන් ය. එවැනි රාජ්‍යයන් තුළ අභ්‍යන්තර ගැටුම් බොහෝමයක් දික්ගැසුණු සමාජ අර්බුධ බවට පත්ව තිබේ. **එඩ්වඩ් අසාර්** නැමති විචාරකයා දක්වන ආකාරයට **දික්ගැසුණු සමහර අර්බුදවල අහිතකර ප්‍රතිඵල ජාතික මට්ටමේ සිට ජාත්‍යන්තරය දක්වා ව්‍යාප්තව පවතී**. **කැල්වින් හොල්ස්ට්** ප්‍රකාශ කරන්නේ රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් බොහෝමයක් උත්පාද වී ඇත්තේ **රාජ්‍ය පාලනය - ජාතීන්ගේ කාර්යභාරය හා තත්වය - රාජ්‍ය අභ්‍යන්තරය තුළ සිටින විවිධ ජනවර්ග වල තත්වය** වැනි සාධක මතය. **නිදර්ශන** ලෙස **ශ්‍රී ලංකාව ඉන්දියාව - පකිස්ථානය - බංගලි දේශය - සෝමාලියාව** වැනි රාජ්‍යය තුළ ඇති වූ රාජ්‍යය අභ්‍යන්තර ගැටුම් දැක්විය හැකිය.

## අන්තර් රාජ්‍යය ගැටුම්.

අන්තර් රාජ්‍යය ගැටුම් යනු **ජාතික රාජ්‍යයන් අතර ඇතිවන ගැටුම් ලෙස සරලව නිර්වචනය කළ හැකිය**. මෙම ගැටුම් උත්පාද වන්නේ **දේශසීමා - සම්පත් බෙදා ගැනීම - දේශපාලන** දර්ශනවාදයන් මත පදනම් වෙමිනි. **නිදර්ශන** ලෙස , **ඉන්දියාව - චීනය , ඉන්දියාව - පාකිස්ථානය , ජම්බු කාශ්මීර භූමියට ඇති වූ ගැටුම, ඉරාන - ඉරාක ගැටුම , උතුරු කොරියාව - දකුණු කොරියාව** අතර ඇති වූ ගැටුම් දැක්විය හැකිය.

- **කුඩා ප්‍රමාණයේ ගැටුමේ සිට මහා පරිමාණ ගැටුම් දක්වා ගැටුම විවිධ ස්වරූපයෙන් වර්ග කොට තිබේ.**

I. **පුද්ගලයන් දෙදෙනෙක් අතර ඇතිවන ගැටුම්.**

සමාජයේ පුද්ගලයන් දෙදෙනෙකු අතර විවිධ කරුණු මත ඇතිවන ගැටුම් මීට අදාළව හඳුනාගත හැකිය.

II. **පවුලක් තුළ ඇතිවන ගැටුම්.**

කුටුකම්භය හෙවත් පවුල තුල අඹු සැමි , මව්පිය , දූ දරු අතර ඇතිවන මත ගැටුම් මීට අදාළ වේ.

III. **පුද්ගල කණ්ඩායම් අතර ඇතිවන ගැටුම්.**

ප්‍රාදේශීය - ආගමික - වාර්ගික - කුල - ගෝත්‍ර වශයන් බේදී පුද්ගල කණ්ඩායම් අතර ඇතිවන ගැටුම් මීට අදාළ වේ.

IV. **රාජ්‍යයන් තුළ රාජ්‍යය විරෝධී කණ්ඩායම් සමඟ ඇතිවන ගැටුම්.**

රාජ්‍යය ප්‍රතිපත්ති වෙනස්කරවා ගැනීම සම්බන්ධයෙන් ඇතිවන කැරලි - උද්ඝෝෂණ - අරගල - විප්ලව මීට අදාළ වේ.

V. **රාජ්‍යය දෙකක් අතර ඇතිවන ගැටුම්.**

දේශසීමා ස්වාභාවික සම්පත් පදනම් කොට ගනිමින් රාජ්‍යයන් දෙකක් මත ඇතිවන ගැටුම්.

VI. **රාජ්‍යයන් කිහිපයක් අතර ඇතිවන ගැටුම්.**

දේශපාලන මතවාද - ආර්ථික - සමාජයීය මතවාද බලකාමය මත ඇතිවන ගැටුම් පළමු හා දෙවන ලෝක යුද්ධ නිදසුන් වේ.

**තවදුරටත්,**

- **ගැටුමට බලපාන සාධක මතද (දෘශ්ටිකෝණය) ගැටුම් විවිධ ස්වරූපයෙන් වර්ග කළ හැකිය.**

I. **දේශපාලන ගැටුම්.**

දේශපාලන මතවාද දර්ශනයන් පදනම් කොට ගෙන ඇතිවන ගැටුම් මිට අදාළ වේ. **නිදර්ශන** ලෙස ඇමරිකානු ප්‍රමුඛ ධනේශ්වර රාජ්‍යය හා සෝවියට් ප්‍රමුඛ වාමවාදී රාජ්‍යයන් අතර පැවති ගැටුම - ඉන්දුනීසියාව නැගෙනහිර ටිමෝරයෙන් වෙනම රාජ්‍යයක් නිර්මාණය කර ගැනීම සඳහා ගෙනගිය සටන.

II. **ආගමික ගැටුම්.**

ආගමික පදනමක් මත උත්පාද වූ ගැටුම් ආගමික ගැටුම් ලෙස නිර්වචනය කළ හැකිය. **නිදර්ශන** ලෙස ලෝක ඉතිහාසය තුළ සිදු වූ කුරුස යුද්ධය , ඉන්දියාවේ මුස්ලිම් - හින්දු අතර ගැටුම දැක්විය හැකිය.

III. **දේශසීමා ගැටුම්.**

දේශසීමා මත පදනම් වී ඇති වූ ගැටුම් මීට අදාළ වේ. **නිදර්ශන** ලෙස ඊශ්‍රායලය - පලස්තීනය අතර ඇති වූ යුද්ධය.

IV. **වරණ භේදවාදී ගැටුම්.**

කළු - සුදු යන වාර්ගික ගැටුම ලෝක ඉතිහාසය තුළ වරින් වර ස්මතු වූවකි. **නිදර්ශන** ලෙස **දකුණු අප්‍රිකාව - ඇමරිකානු රාජ්‍යයන්** තුළ ඇති වූ ගැටුම් දැක්විය හැකිය.

V. **ආර්ථික හා සම්පත් සම්බන්ධයෙන් වන ගැටුම්.**

ස්වාභාවික සම්පත් පදනම් කොටගෙන උත්පාදවන ගැටුම් මීට අදාළ වේ. විශේෂයෙන් ඛණිජ තෙල් අනුභූතිය කොටගත් ගැටුම් ලෝක ඉතිහාසය තුළ දක්නට ලැබේ. **නිදර්ශන** ලෙස ඇමරිකාව - ඉරාකය අතර ගැටුම.

VI. **ගෝත්‍රික හෝ කුළ ගැටුම්.**

ගෝත්‍ර හෝ කුළය මත පදනම්ව උත්පාද වන ගැටුම් මීට අදාළ වේ. **නිදර්ශන** ලෙස දකුණු අප්‍රිකානු රාජ්‍යයන් තුළ පවත්නා ගෝත්‍රික ගැටුම් - උතුරු හා බටහිර කඳුකර ගෝත්‍ර ජනයා සම්බන්ධ තායිලන්ත ක්‍රියාවන් - ඉන්දියාවේ හින්දු හරි ජනයා අතර ඇතිවන ගැටුම්.

- **ගැටුමක ගති ලක්ෂණ අනුවද ගැටුම් වර්ග කළ හැකිය.**

I. **දික්ගැස්සුණු ගැටුම්.**

ගැටුමට අදාළ සාධකවල සංකීර්ණ භාවය නිසා මත පදනම්ව දික්ගැස්සුණු ගැටුම් උත්පාද වීම හා ව්‍යාප්ත විම සිදුවේ.

II. **විසඳීමට දුෂ්කර ගැටුම්.**

මෙම ගැටුම් ද දික්ගැස්සුණ ගැටුම් වලට සාම්‍යතාවයක් දක්වයි.

III. **මිලිටරීකරණය වූ ගැටුම්.**

අවි ආයුධ භාවිතා කරමින් යුධමය ස්වරූපයෙන් සිදුකරනු ලබන ගැටුම් මීට අදාළ වේ.

- <u>ගැටුම්වල වැදගත් (සාධනීය) ලක්ෂණ හඳුනාගත හැකිය.</u>

ගැටුම නෛසර්ගිකවම අයහපත් දෙයක් නොවේ. ගැටුම් තුළින් ඓතිහාසික තත්වයන් තුළ සිදුව ඇත්තේ සමාජයේ ඉදිරිගාමී ප්‍රවර්ධනයකි. කාල් මාක්ස්ට අනුව ඓතිහාසික සමාජ ප්‍රවර්ධනයට හා අනාගතයේ උත්පාද වන විද්‍යාත්මක කොමියුනිස්ට් සමාජය බිහි වීමට ද හේතු වන්නේ ගැටුම යන සමාජ ප්‍රභවයයි.

1. **ගැටුම යනු විසඳීමට අපහසු ප්‍රශ්න මාලාවක් වෙනත් ආකාරයකින් ප්‍රකාශයට පත් වීමකි.**

2. **ගැටුම් උත්පාද වන විට එමගින් පැහැදිලි වන්නේ ඒ දක්වා අවධානය යොමු නොකළ ප්‍රශ්න සමූහයක් කෙරෙහි අවධානය යොමු කිරීමයි.**

3. **ප්‍රශ්න වලට විසඳුම් සෙවීමට බලකිරීමක් වීම.**

4. **ගැටුම මගින් ජනතාව සතු පීඩනය මුදා හැරීමට හැකි වීම.**

- <u>ගැටුම්වල දුර්වල (ප්‍රතිශේධනීය) ලක්ෂණයන් හඳුනාගත හැකිය.</u>

1. **ප්‍රචණ්ඩකාරී ගැටුම් වලින් ජීවිත හානි සම්පත් හානි සිදු වීම.**

2. **රාජ්‍යය හා ජාතික ආරක්ෂාසහිත භාවයට අයහපත් වීම.**

3. **පුද්ගලයන් - පුද්ගල කණ්ඩායම් - රාජ්‍යය අතර වෛරය , අසමගිතාවය උත්පාද වීම.**

4. **සමාජ ඒකග්‍රතාවය බිඳ වැටීම, සමාජය භේද භින්න වීම.**

නිදර්ශන -: II වන ලෝක මහා සංග්‍රාමය නිසා මිනිසුන් හාරකෝටි හැත්තෑ ලක්ෂයක් මිය යාම.
කාජිනියා කොමිසම පෙන්වා දෙන ආකාරයට 20 වන සියවස තුල මිලියන සියයකට වඩා යුද්ධය නිසා මිය යාම.

- ## <u>රටක සංවර්ධනයට ගැටුම් වලින් වන හානිය.</u>

I. ජීවිත හා දේපල හානි සිදුවීම.

II. පරිසරය හා ස්වාභාවික සම්පත් විනාශ වීම.

III. ශාරීරික ආබාධිතයන් ඇතිවීම, මානසික ආබාධ වලට ගොදුරුවීම , පවුල් අවුල් වැඩි වීම, සරණාගත කඳුවරු වර්ධනය වීම, සමස්තයක් ලෙස සමාජ ක්‍රමයම අර්බුදයට කරා ගමන් කිරීම.

IV. රටේ ආර්ථික හා ජීවන මාර්ග බිඳවැටීම නිසා සිදුවන ආර්ථික ගැටළු.

V. විශාල හමුදාවක් නඩත්තු කිරීම සහ නවීන යුධ අවි සඳහා වියදම් අධික වීම.

VI. තරුණ ප්‍රජාවේ අධ්‍යයනය බිඳවැටීම සමග මානව සදාචාරය පිරිහීමට හැකි වීම.

VII. භෞතික හානි, නැවත ගොඩ නැගීම සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදු වීම.

VIII. ජාත්‍යන්තර සම්බන්ධතා බිඳ වැටීමට හේතු වීම. විශ්වාසය - මිත්‍රත්වය බිඳ වැටීම අවිශ්වාසය අසමගිය උත්පාද වීම.

- ## <u>ගැටුම් නිරාකරණය පිළිබඳ සංකල්පය.</u>

ගැටුම් නිරාකරණය පිළිබඳ සංකල්පය ඉදිරියට පැමිණීමට බලපෑ හේතු කිහිපයක් හඳුනාගත හැකිය. ඒ අතර විශාල වශයෙන් මානව සම්පත් හා භෞතික සම්පත් විනාශවී යාම මූලික හේතු සාධකයක් ලෙස පෙන්වා දිය හැකිය.

නිදර්ශන -: එඩ්වර්ඩ් හා අසාර් දක්වන ආකාරයේ දික්ගැසුණු සමාජ ගැටුම්වල අහිත කර ප්‍රතිඵල ජාතික මට්ටමේ සිට ජාත්‍යන්තර මට්ටම දක්වා ව්‍යාප්ත වීම.

මිනිස් ජීවිත බිළිගත හැකි ගැටුම් වැලැක්වීම පිළිබඳ කාර්නිජි කොමිසම (Carnegie Commission) පෙන්වා දෙන ආකාරයට 20 වැනි සියවසේ මිනිසුන් මිලියන 100 වඩා යුද්ධය නිසා මිය ගොස් තිබේ. 1990 වසරේ දී මිලියන 40 ක් සරණාගතයින් ලෙස ස්වකීය මව්බිම අතහැර දමා ගොස් තිබේ.

යුද්ධයෙන් පසුව කුවේටය හා බොස්නියාව ප්‍රති නිර්මාණය කිරීම සඳහා ගණන් බලා ඇති වියදම ඇමරිකානු ඩොලර් බිලියන 100 කි.

මානසික වශයෙන් යුද්ධයක දී ඇති කරනු ලබන බලපෑම නිශ්චිත මිනුමකින් මානය කළ හැක්කක් නොවේ.

"පළමු හා දෙවන ලෝක යුද්ධය නිසා මානව ජීවිත හාරකෝටි හැත්තෑ ලක්ෂයක් අහිමි වීම."

මෙවැනි තත්වයක් නිසා මිනිසුන් අතර ඇතිවන ගැටුම් වැළැක්වීමට අවශ්‍ය උපක්‍රම ගවේෂණය කිරීම සමාජයීය විද්‍යා තුලින් ඉදිරියට පැමිණියේ ය. ඒ අනුව නව ගැටුම් නිරාකරණ සංකල්ප කිහිපයක් නිර්මාණය විය.

1. ගැටුම වැළැක්වීම.
2. ගැටුම් සමථනය
3. ගැටුම් කළමණාකරණය.
4. ගැණුම් නිරාකරණය
5. ගැටුම් විපරිවර්ථනය (විපරිනාමය)

01. <u>ගැටුම වැළැක්වීම.</u>

ගැටුම වැළැක්වීම යන්නෙහි සරල අර්ථය වන්නේ, ගැටුමක් උත්පාද වීමට පූර්වයේ එය වල්කවා ගැනීමයි. "**සුව කිරීමට වඩා වලක්වා ගැනීම වඩාත් යහපත් ය**" යන සිද්ධාන්තය මත ගැටුම් වැළැක්වීම සම්බන්ධ සංවාදය ඉදිරියට පැමිණ තිබේ. ඇතැම් රෝගයක් ඇති වුනායැයි උපකල්පනය කළ හොත් එය සුව කිරීමට අපහසුවිය හැකිය. ඇතැම්විට සුව කිරීමට නොහැකිවිය හැකිය. එවැනි තත්ත්වයන් මත ගැටුම ඇතිවීම වැළැක්වීම , එය ඇති වූ පසු විසඳීමට දරනු ලබන උත්සාහයට වඩා අර්ථවත් වන බව බුද්ධිමතුන්ගේ මතය වේ.

ගැටුම් වැළැක්වීම, ගැටුම් නිරාකරණය තුළට එකතු වන්නේ 1950 ට පශ්චාත් කාලීන අවධියේ ය. මීට අදාළ න්‍යායික පදනම **කෙනත් බෝල්ඩින් - ක්වින්ස් රයිට්** වැනි බුද්ධිමතුන් සපයා තිබේ. පසුව එක්සත් ජාතීන්ගේ සංවිධානය මීට අදාළ ප්‍රධාන මූලාශ්‍රය බවට පත්විය. පසුව තවදුරටත් රාජ්‍යය නොවන සංවිධාන තුලින් ගැටුම වලක්වා ගැනීමට අදාළ සංවාදය වර්ධනය කළේ ය.

- **ගැටුම වැළැක්වීම ප්‍රධාන අදියර තුනක් යටතේ සිදුකළ හැකිය.**

I. <u>නිශේධාත්මක ගැටුමක් නොමැති තත්වයක් තුළ අනාගතයේ එවැන්නක් ඇතිවේ යැයි සිතා එය වැළැක්වීමට අදාළ විධි විධාන යෙදීම.</u> වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් ප්‍රචණ්ඩ ගැටුමක් ඇති වීමට ඇති අවකාශය සීමා කිරීම. ඊට අදාළව ගත හැකි ක්‍රියාමාර්ග කිහිපයකි. **ගැටුමක් ඇති වී ඉදිරියට වර්ධනය වීමට ඇති ඉඩකඩ අසුරාලමින් ක්‍රියාකාරී සැලසුම් සම්පාදනය කිරීම - ගැටුම මතුවීම වැළැක්වීමට නිවාරාත්මක ප්‍රතිකර්ම යෙදීම.**

II. <u>දැනට ඇති වී තිබෙන ගැටුමක් අනාගතයේ දී විනාශකාරී හා ප්‍රචණ්ඩකාරී වේ යැයි සිතා එය වැළැක්වීමට ක්‍රියා කිරීම</u>. මේ සඳහා භාවිත කළ හැකි ක්‍රියාමාර්ග කිහිපයකි. දැනට ඇති වී තිබෙන ගැටුමක් තිරස් සිරස් අතට තීව්‍ර වීම වැළැක්වීම සඳහා කටයුතු කිරීම - පෙර සිට ක්‍රියාත්මක වන ගැටුමක් වෙනත් ප්‍රදේශවලට තිරස් අතට ව්‍යාප්ත වීම වැළැක්වීම - ව්‍යසනකාරී ගැටුම්වල ප්‍රතිවිපාක අවම කිරීමට සහනදායී වැඩසටහනක් ක්‍රියාවට නැංවීම.

III. ආයුධ සන්නද්ධ ගැටුම් ඇතිවීම වැළැක්වීම. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් ගැටුම විසඳීමෙන් පසුව නැවත එම ගැටුම් මතුවීමේ අවකාශය ලොප් කිරීම.

- **ගැටුම් වැළැක්වීමට භාවිත කරනු ලබන ක්‍රම කොටස් දෙකකට බෙදිය හැකිය.**

I. සැහැල්ලු ගැටුම් වැලැක්වීම.
II. ගැඹුරු ගැටුම් වැලැක්වීම (විචක්ෂණ ගැටුම් වැලැක්වීම)

| I | සැහැල්ලු ගැටුම් වැලැක්වීම. |
|---|---|

සැහැල්ලු ගැටුම් වැලැක්වීම යන්නෙන් අර්ථවත් වන්නේ, ගැටුමක් ප්‍රචණ්ඩත්වය කරා ව්‍යාප්තවීමට ඇති අවකාශය වැලැක්වීමයි. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම්, නිලීන ගැටුමක් දරුණු අවි සන්නද්ධ ගැටුමක් බවට ව්‍යාප්තවීමට අවකාශය ලබා නොදීමයි. ඊට අදාළව භාවිතා කරන ක්‍රියාමාර්ග, **රාජ්‍යය තාන්ත්‍රික මැදිහත්වීම , පුද්ගලික මට්ටමින් මැදිහත්වීම, කොමිෂන් සභා පත් කිරීම.**

| II | ගැඹුරු ගැටුම් වැළැක්වීම. |
|---|---|

ගැඹුරින් ගැටුම වැළැක්වීම වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් විචක්ෂණ ගැටුම් වැලැක්වීම ලෙස ද හඳුන්වයි. මෙම ක්‍රමය තුළ දී ගැටුමට හේතු වී ඇති ගැටුම් මූලයන්ට ආමන්ත්‍රණය කරයි. මීට අදාළව සිදු කරනු ලබන කාර්යන් කිහිපයකි. **ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම - සංවර්ධනය වේගවත් කිරීම - නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීම - මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.** ගැටුම වැලැක්වීම යනු ගැටුම සම්බන්ධ අවසාන පිළියම නොවේ. **ගැටුම වැළැක්වීම උපරිම ප්‍රතිඵලදායී කර ගැනීම සඳහා අංශ කිහිපයක් කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ.**

- **ගැටුම් සන්දර්භ (ව්‍යුහය) විශ්ලේෂණයක් හරහා ගැටුමට සම්බන්ධ මූලිකාංග වන පාර්ශවය - ක්‍රියාකරුවන් - බලවේග අවබෝධ කර ගැනීම.**

- **විවිධ ස්ථානවල ගැටුම් සූචකයක් යෙදවීම.**

- **විශේෂිත ගැටුම් ආමන්ත්‍රණය කිරඹීට අවශ්‍ය යාන්ත්‍රණය හා ව්‍යුහයන් සඳහා ගැනීම.**

- **ගැටුම් නැතිවීම සම නව ක්‍රම පිළිබඳව නිර්මාණාත්මකව සිතීම.**

ගැටුම් වැලැක්වීම සම්බන්ධයෙන් පවතින මූලික ගැටළුව වන්නේ ගැටුම් මූලයන් හඳුනාගන්නේ කෙසේ ද යන්නයි. මෙම තත්වය නිසා ගැටුම් වැලැක්වීම සම්බන්ධ වන තවත් ක්‍රමයක් ලෙස **පූර්ව අනතුරු හඳුනා ගැනීමේ සංඥා** ඉදිරියට පැමිණ තිබේ. පූර්ව අනතුරු හඳුනා ගැනීම සම්බන්ධ සංවාදය 1980 - 1990 දශකවල ගැටුම් නිරාකරණයට අදාළ ප්‍රපංචයක් ලෙස ඉදිරියට පැමිණයයි. පූර්ව අනතුරු හඳුනා ගැනීමේ සංඥා තුළ දී අවධානය යොමු කරනු ලබන්නේ **ගැටුම් පිළිබඳ පූර්වයෙන් හඳුනාගත හැකි උපාංග පද්ධතියක් නිර්මාණය කිරීමයි**. ගැටුම් වලට අදාළ පූර්ව සංඥා කිහිපයක් පහත පරිදි දැක්විය හැකිය.

- එක් කණ්ඩායම් විසින් තවත් කණ්ඩායමක හෝ ආරක්ෂක අංශ විසින් විශේෂිත ජන වර්ගයකට කරදර හිරිහැර කිරීම ඉහළ යාම.

- ප්‍රචණ්ඩ සිදුවීම් ඉහළ යාම.

- ජන කොටස් අතර ගැටුම් තීව්‍ර වීම.

- එක් සමාජ කණ්ඩායමක් අනෙක් සමාජ කණ්ඩායම් අතර සන්නිවේදන කටයුතු අතහැර දැමීම.

- සමාජ කණ්ඩායම් විසින් දුක් ගැනවිලි නැවත නැවත ඉදිරිපත් කිරීම.

- යුක්තිය හෝ සාධාරණත්වය ආරක්ෂාව සඳහා පවතින සමාජ ව්‍යූහයන් පිළිබඳ විශ්වාසනීයත්වය අවම වීම.

- සමාජ හා දේශපාලන ආතතිය.

- නියෝජන අසමතුලිතතාවය.

- අසම තුලිත සංවර්ධනය.

මියාල් විසින් විවිධ මට්ටම්වල ගැටුම් ඇතිවීමට බලපෑ සාධක හා වැලැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ග පහත පරිදි දක්වයි.

| ගැටුම් ඇතිවීමට බලපාන සාධක | වැලැක්වීමේ ක්‍රියාමාර්ග |
|---|---|
| • ලෝක මට්ටම<br>- නොගැලපෙන අන්තරංග ව්‍යූහයන් - | අන්තර් ජාතික ක්‍රමයේ වෙනස්කම් |
| • කලාපීය මට්ටම<br>- කලාපීය වශයෙන් විසිර ඇති ජනකොටස් | කලාපීය ආරක්ෂණ විධි විධාන |
| • රාජ්‍ය මට්ටම<br>- වාර්ගික ස්ථිරකණය<br>- දුර්වල ආර්ථිකයන්<br>- අධිපතිවාදී පාලනය<br>- මානව අයිතිවාසිකම් උල්ලංගනය | - සමූහ සංගත ප්‍රතිපත්ති / ෆෙඩරල්වාදය ස්වායත්තතාවය<br>- සුජාතභාවය , ප්‍රජාතන්ත්‍රීකරණය<br>- නීතියේ ආධිපත්‍යය,<br>- මානව අයිතිවාසිකම් සුපරීක්ෂණය සහ ආරක්ෂණය. |
| • සමාජ මට්ටම<br>- නොදියුණු සමාජයන්<br>- දුර්වල සන්නිවේදන ක්‍රම<br>- ධ්‍රැවීකරණය වූ ආකල්ප | - සිවිල් සමාජය ශක්තිමක් කිරීම.<br>- වටමේස සාකච්ඡා , වැඩමුළු , ප්‍රජා සම්බන්ධතා<br>- සංස්කෘතික මට්ටමේ වැඩ |
| • ප්‍රභූත්ව / පුද්ගල මට්ටම<br>- පරාරෝපනික ප්‍රතිපත්ති | - ශක්තිමත් ප්‍රමිතකරණයන් |

තවදුරටත්,

ගැටුම වළක්වා ගැනීමට ගත හැකි පියවර...

- **සිදුවීම් විමර්ශනය කිරීම මගින් ගැටුම් වලට සම්බන්ධ පුද්ගලයන් සහ සත්‍ය වශයෙන් සිදු වී ඇති දෙය පැහැදිලි කර ගැනීම.**

- **වැරදි අවබෝධ නිවැරදි කිරීමට කට කථා සහ නොමග යැවෙන ප්‍රකාශනයන් සිදු කිරීම පාලනය කිරීම.**

- **විවිධ පාර්ෂව අතර සංවාදයන් ගොඩ නැගීමට පහසුකම් සැලසීම.**

- **ගැටුමට සම්බන්ධ පාර්ශව මුණ ගැසීම හා ඔවුන් අතර සහෝදරත්වය ගොඩ නැගීම.**

- **විරුද්ධපාර්ෂව අතර විශ්වාසනීයත්වය ගොඩ නැගීම.**

- **ප්‍රති සංවිධාන ගත වීම ධෛර්මත් කිරීම.**

- **ගැටුම් සහගත තත්වයන් යලි ඇති නොවීමට ප්‍රතිඥා දීමට ගැටුමට අදාළ පාර්ශව පෙළඹවීම.**

- **ශාරීරික , මානසික , ආත්මීය වශයෙන් ඇති වී ඇති ආතතීන් සුව කිරීමට කටයුතු කිරීම.**

ගැටුම වැළැක්වීමේ ක්‍රියාදාමය ඉතා තාර්කිකව, බුද්ධමත්ව ඉවසිලි වන්තව සිදු කළ යුතු කාර්යක් බව ප්‍රත්‍යක්ෂ වීමට උක්ත කරුණු හේතු වේ. ගැටුම සම්බන්ධයෙන් ධනාත්මකව ක්‍රියාත්මක වීමේ දී විනාශකාරී ගැටුම් වැළැක්වීම ඉදිරියෙන් සිටී.

## 2. <u>ගැටුම් සමථනය.</u>

ගැටුම් සමථනය යනු **<u>ප්‍රචණ්ඩකාරී ගැටුමක ප්‍රචණ්ඩත්වය සමනය කිරීමයි</u>**. පාර්ශව දෙකක් හෝ වැඩි ගණන අතර ඇති වී ඇති විනාශකාරී සහ ප්‍රචණ්ඩ ගැටුමක් තුළ විනාශකාරී භාවය හා ප්‍රචණ්ඩකාරී බව ඉවත් කිරීමට මෙහිදී ක්‍රියා කරයි. මෙහි දී ගැටුමට තුඩු දී ඇති විශේෂ හෝ සාමාන්‍යය කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු නොකරයි. ඊට හේතු වන්නේ ප්‍රචණ්ඩත්වය සහිත ගැටුමේ තීව්‍රතාවය අවම කිරීම එහි අරමුණ වීමයි. ගැටුම් සමථනයේ අරමුණ වන්නේ ප්‍රචණ්ඩකාරීත්වයෙන් සිදුවන හානිය අවම කර ගැනීමයි. මෙය ගැටුමේ අවසානය නොවන මුත් ගැටුම් නිරාකරණය කිරීමේ මූලික අවස්ථාව විය හැකිය.

ගැටුම් සමථකරණයට අදාළව හමුවන ප්‍රධාන අභියෝගය වන්නේ එය සිදු කරනු ලබන්න් කුමන ක්‍රියාවලිය මගින් ද යන්න සොයා ගැනීමයි. මියාල් ඇතුළු පිරිස පෙන්වා දෙන්නේ **ගිවිසුමක්** මාර්ගයෙන් මෙම කාර්ය සිදු කළ හැකි බවයි. ඒ සඳහා <u>සටන් විරාම ගිවිසුමක්</u> හෝ සාම <u>ගිවිසුමක්</u> භාවිතා කළ හැකි බව පෙන්වා දෙයි. මෙවැනි ගිවිසුමක් මගින් ගැටුම් තුළ ඇති ප්‍රචණ්ඩකාරී තීව්‍රතාවය අවම කළ හැකිය.

නිදර්ශන -: උතුරු අයර්ලන්ත ගැටුමට සම්බන්ධ පාර්ශව අතර 1998 අප්‍රේල් මස 10 දින අත්සන් කළ **මහ සිකුරාදා ගිවිසුම.**

2002 පෙබරවාරි 22 දින ශ්‍රී ලංකා ආණ්ඩුව සහ එල්.ටී.ටී.ඊ සංවිධානය අතර අත්සන් කළ අවබෝධතා ගිවිසුම.

ගැටුම සමථකරණ ක්‍රියාවලිය මගින් ගැටුමේ ප්‍රචණ්ඩත්වය අවම කිරීම ප්‍රධාන වේ. එම නිසා එය ගැටුමේ අවසානය නොවේ. සමථකරණය තුළ දී ගැටුම උත්පාද වීමට අදාළ මූල බීජ තත්වයන් සම්බන්ධයෙන් අවධානය යොමු නොකරයි. එම නිසා නැවත ගැටුම ආරම්භ වීමේ අවකාශය පවතී.

03. ගැටුම් කළමණාකරණය.

ගැටුම් කළමණාකරණය යනු **ගැටුමට සම්බන්ධපාර්ශව තුළ ධනාත්මක චර්යා වෙනස් කම් මගින් අනාගතයේ ඇතිවිය හැකි ප්‍රචණ්ඩ ක්‍රියා සීමා කිරීම සහ මගහැරවීමයි.** මියාල් (**Miall**) ඇතුළු පිරිස ගැටුම් කළමණාකරණය නිර්වචනය කරනු ලබන්නේ , ප්‍රචණ්ඩ ගැටුමක් සීමා කිරීම, සැහැල්ලු කිරීම සහ පැතිරීම නතර කිරීමට යනුවෙනි. ගැටුම් කළමනාකරණය පිළිබඳ අදහස 1980 දශකයේ දී ඉදිරියට පැමිණෙන්නකි.

- ගැටුම් කළමනාකරණය මගින් අපේක්ෂිත අරමුණු තුනකි.

I. **ගැටුමේ ප්‍රචණ්ඩත්වය හා විනාශකාරී භාවය අවම කිරීම.**

II. **ගැටුම තීව්‍රතාවය ජන සංහාරක අවි පාවිච්චි කිරීමට තරම් මිටමකට ව්‍යාප්ත වීම වැළැක්වීම.**

III. **වෙනත් දිශාවන්ට තිරස් ලෙස ගැටුම ව්‍යාප්ත වීම වැළැක්වීම.**

1996 දී **ලන්ඩ්** (Lund) නැමති විචාරකයා පෙන්වාදුන් ආකාරයට ගැටුම් කළමනාකරණය මගින් ඉටුකර ගැනීමට අපේක්ෂිත ප්‍රධාන කරුණු දෙකක් පවතී.

I. **ප්‍රචණ්ඩ ගැටුම් මගින් සිදුවන හානිය අවම මට්ටමකට ගෙන ඒමේ අන්තර් ක්‍රියාකාරී ආකෘතියක් තුළට විපර්වර්ථනය කිරීම.**

II. **ගැටුම් තීව්‍රලෙස ව්‍යාප්තවීම වළක්වමින් ගැටුමට සම්බන්ධ පාර්ෂව ගැටුම් නිරාකරණයක් දෙසට යොමු කරවා ගැනීම. හෝ මිනිස් ඝාතනය නතර කිරීමට සටන් විරාම , සාම ගිවිසුම් වැනි උපක්‍රම මගින් කටයුතු කිරීම.**

ගැටුම් කළමනාකරණය යන්න අංශ දෙකකින් අර්ථ දැක්වීම කළ හැකිය. එනම් පළමු වැන්න ගැටුම කළමනාකරණය කිරීම හෙවත් ගැටුම යම් සීමාවක් තුළට සීමා කිරීමයි. **දෙවනුව ගැටුමට සම්බන්ධ පාර්ශව එක් අන්තර් ක්‍රියාකාරී ආකෘතියක් වෙතට ගෙන ඒමයි.**

ගැටුම් කළමනාකරණය පිළිබඳ සංවාදය ගැටුම් නිරාකරණය තුළ ඇති අතිශය වැදගත් තේමාවකි. ඊට හේතු වන්නේ ගැටුම් නිරාකරණය ඉතා සංකීර්ණ දීර්ඝ ක්‍රියාවලියක් වීමත්, ගැටුම් නිරාකරණ කාර්යන් අසාර්ථකවීමත් ය. මෙම තත්ත්වය මත ගැටුම නිරාකරණය හෙවත් විසඳීමට පෙර ගැටුම කළමණාකරණය කළයුතු බව පොදු පිළිගැනීමක් පවතී. ඇතැම් බුද්ධිමතුන්, විචාරකයින් , විද්වතුන් , ලේඛකයන් පෙන්වා දෙන්නේ ජනවාර්ගිකත්වය මත පදනම් වූ ගැටුම් විසඳීමට නොහැකි බවත් යම් තාක් දුරකට ඒවා කළමණාකරණය කිරීමට හැකි බව පමණි.

> **"වාර්ගික ගැටුම් කළමණාකරණය කිරීම අඛණ්ඩ ක්‍රියාදාමයකි. එහි අවසානය නිරාකරණයක් සහිත එකක් නොවේ."**
>
> **(ලේක් - රොත්චයිල්ඩ්)**

ගැටුම් කළමණාකරණය කිරීමේ දී ගැටුමට සම්බන්ධ පාර්ශව වල අනන්‍යතාවය - අයිතිවාසිකම් - තහවුරු කරමින් ඒවා ප්‍රවර්ධන කිරීම සහ සංවරණය කටයුතු තුලිත මට්ටමකින් පවත්වාගෙන යාමට අදාළ යාන්ත්‍රණය නිර්මාණය කළ යුතු ය.

## 04. ගැටුම් නිරාකරණය.

ගැටුම නිරාකරණය යන භාෂාමය වාක් සංකේතය බහු අර්ථ සහිතව විවිධ ක්ෂේත්‍ර තුළ නිර්වචනය වන පදයකි. මෙම තත්වය මත ගැටුම නිරාකරණය යන පදයෙන් අර්ථ නිරූපණය වන්නේ කුමක් ද යන්න පිළිබඳව බහුවිධ මතවාද හඳුනාගැනීමට සිදුවේ. ඒ අතර **යුධ විශේෂඥයින්, අධ්‍යාපනඥයින් , රාජතාන්ත්‍රිකයින්** ස්වකීය විෂය වපසරිය තුළ ගැටුම් නිරාකරණය අර්ථකථනය කොට තිබේ.

**යුධ විශේෂඥයින්** ගැටුම් නිරාකරණය අර්ථ නිරූපණය කරනු ලබන්නේ, **තර්ජනය කිරීම හරහා සාර්ථකව යටත්කර ගැනීමක් හෝ බල කිරීම මගින් හෝ එසේ නොහැකි වුවහොත් මිලිටරිය බලය සාර්ථක ලෙස යෙදවීම මගින් යුද්ධය අවසාන කිරීම හෝ වැලැක්වීමයි.** මෙම යුධ විශේෂඥයින් විසින් ඉදිරිපත් කරන ගැටුම් නිරාකරණ යාන්ත්‍රණය ගැටුම් නිරාකරණයට අදාළ න්‍යායාචාර්යවරුන්ගේ ගුරුකුලය. විසින් ප්‍රතික්ෂේප කරයි. ඊට හේතු වන්නේ එහි ඇති ප්‍රචණ්ඩ කාරීත්වය හා විනාශකාරීත්වය යි. නමුත් එම න්‍යායාචාර්යවරුන් ගැටුම් විසඳීම සඳහා බලය යෙදවීම අත්‍යවශ්‍ය මූලිකාංගයක් ලෙස පිළිගනී.

ගැටුම් නිරාකරණය පිළිබඳ ඉදිරිපත්වී ඇති මතයක් වන්නේ, <u>ගැටුම් නිරාකරණය යනු</u> , **ගැටුම නිවාරණය - ගැටුම සමථනය - ගැටුම කළමණාකරණය - ගැටුම පරිණාමනය යන ආදී සියලු අංශ ඇතුළත් පුළුල් ක්‍රියාදාමයක් බවයි.**

තවත් පිරිසක් ගැටුම් නිරාකරණය ලෙස අර්ථ දක්වන්නේ, **නිර්මානාත්මකව හා අවිහිංසාවාදීව ප්‍රශ්න විසඳමින් ගැටුම් සම්බන්ධ සියලු පාර්ශව වල අනන්‍යතාවය හඳුනාගනිමින් , ඔවුන්ගේ මානව අවශ්‍යතාවයන් හා ආශාවන් හඳුනාගනිමින් අවශ්‍ය පිළියම් යෙදීමයි.**

<u>සයිමන් ෆිෂර් ඇතුළු කණ්ඩායම</u> ගැටුම නිරාකරණය යනුවෙන් අර්ථවත් කළේ , **ගැටුම් පාර්ෂව අතර නව්‍ය සහ අවසන් සම්බන්ධතාවයන් ගොඩ නැගීමයි.**

ලුන්ඩ් (Lund) ට අනුව ගැටුමට සම්බන්ධ පාර්ෂව අතර සහයෝගීතාවය ඉහළ නැන්වීමට දරණු ලබන ප්‍රයත්නයන් ගැටුම් නිරාකරණය වේ. ගැටුමට මගපෑදූ තත්වයන් ආමන්ත්‍රණය කරමින් ගැටුම් පාර්ෂව අතර සම්බන්ධතාවය තහවුරු කරනු ලැබේ. ධනාත්මක ආකල්ප පෝෂණය කරනු ලබයි. ප්‍රතිසංවිධාන ගත ප්‍රාරම්භනය මගින් අවිශ්වාසය තුරන් කෙරේ. ගැටුම් පාර්ශව වල අන්තර් ක්‍රියාකාරීත්වය ගොඩනැගීම හෝ ශක්තිමත් කිරීම සඳහා ආයතන සහ ක්‍රියාදාමයන් ආරම්භ කරනු ලැබේ. ගැටුම නිරාකරණය මගින් ප්‍රචණ්ඩත්වය සඳහා ඇති හැකියාව අවම කරන අතර ප්‍රති - තීව්‍රතාවය වැලැක්වීම සඳහා ද ක්‍රියා කරනු ඇත.

1995 වසරේ දී ක්ෂමා සංවිධානය ගැටුම නිරාකරණය පහත පරිදි නිර්වචනය කළේ ය. ගැටුම්කාරී ප්‍රජාවන් අතර පාලමක් ගොඩ නැගීමට ක්‍රියාකිරීම. ඔවුන් අතර ගැටුම් කාරීත්වයක් ඉදිරිට ගෙන ඒමට තුඩු දී ඇති සාධක පැහැදිලි කිරීමට ක්‍රියා කිරීම යන සාමකාමී වෙනස්කම් කිරීමේ ක්‍රියාදාමයක් හා තෘණ මූල මට්ටමේ ප්‍රතිසංවිධාන ගත කිරීමක් මගින් නව සම්බන්ධතා සංවර්ධනය කිරීමට අවශ්‍ය අවස්ථා නිර්මාණය කිරීම ගැටුම් නිරාකරණය වේ."

- ගැටුම නිරාකරණය තුළ හඳුනාගත හැකි මූලික ලක්ෂණ කිහිපයකි.

  - **ගැටුමට සම්බන්ධ මූලයන් උදුරා දැමීමට ක්‍රියා කිරීම.**
  - **ගැටුම් පාර්ෂව අතර නව සම්බන්ධතා ගොඩ නැගීමට ක්‍රියාකිරීම.**
  - **ධනාත්මක ආකල්ප ජනිත කිරීම.**
  - **ප්‍රචණ්ඩත්වය ප්‍රති - තීව්‍රකිරීමට ඇති ඉඩකඩ ඉවත් කිරීම.**

**(N.B)** *ගැටුම නිරාකරණය තුළ, ගැටුම වැලැක්වීම - ගැටුම සමථකරණය - ගැටුම් කළමණාකරණය ආදී අංග පවතී. තව දුරටත් ගැටුමට හේතු වී ඇති කරුණු ඉතා ගැඹුරින් අධ්‍යයනය කිරීම ද ඒ සඳහා වැදගත් වේ.*

- **ගැටුම් නිරාකරණයේ වාසි දායක තත්ත්වයන්.**

  - සතුරුව සිටි කණ්ඩායම් මිතුරු වීම, එමගින් සහයෝගය මානව සම්පත් සංවර්ධනය හා ජාතික අනන්‍යතාවය තහවුරු වීම.

  - ගැටුම තුළින් නිර්මාණය කර තිබූ අස්ථාවර බව පහව යාමෙන් පොදුවේ ජනතාව තුළ ඇතිවන උද්යෝගය හා උනන්දුව රාජ්‍යය සංවර්ධනයට හේතු වීම.

  - ජීවිත හා දේපළ හානි අවසන් වීම.

  - යුධායුද සඳහා වියදම් වන මුදල් රාජ්‍යය සංවර්ධනය සඳහා යෙදවිය හැකි වීම.

  - ගැටුම් නිසා රටේ ස්වභාවයට වායු ගෝලයට පරිසරයට වන හානිය අවසන් වීම.

  - ජාත්‍යන්තර සබඳතා වර්ධනය හා අයෝජකයින් පැමිණීම.

  - පුනරුත්ථාපන කටයුතු පවත්වා ජනතාවට ස්ථාවර පදිංචි ස්ථාන ලබාදිය හැකි වීම.

## 05. <u>ගැටුම් විපරිවර්ථනය (විපරිනාමය)</u>

ගැටුම් විපරිවර්ථනය යනු, **<u>ගැටුම් නිරාකරණයට වඩා පුළුල් ව්‍යූහාත්මක අංශ කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන අවස්ථාවයි</u>**. සරලව දක්වන්නේ නම් **ගැටුම් නිරකාරණය තුළ දී සිදුවන්නේ ගැටුමට අදාළ පාර්ෂව අතර පවත්නා ප්‍රතිවිරෝධතාවය සමනය කර සියළු පාර්ෂව වලට සෑහීමකට පත්විය හැකි තත්වයක් උදාකරයි. ඉන් ඔබ්බෙහි ගැටුමට අදාළ පාර්ෂව වල ආකල්ප - හැසිරීම් - වෙනස් කිරීම සම්බන්ධයෙන් භාවිතා කරනු ලබන ක්‍රියාමාර්ගය ගැටුම් විපරිවර්තනය වේ.**

ඇතැම් විචාරකයින් පෙන්වා දෙන්නේ ගැටුම් විපරිවර්ථනය ගැටුම් නිරාකරණයෙන් ඔබ්බට ගිය පියවරක් ලෙසිනි. ඇතැමුන් නිරාකරණයේම දිගුවක් ලෙස එය හඳුනාගනී.

- ගැටුම් විපර්වර්ථනය තුන් ආකාරයකට නිර්වචනය කළ හැකිය.

  I. සමස්ත ගැටුම් සන්දර්භය වෙනස් කිරීම.

  II. ගැටුම් පාර්ෂවයන්හි සම්බන්ධතා වෙනස් කිරීම.

  III. සවිබලකරණය හා ගැටුමට සම්බන්ධ පුද්ගල මට්ටම් වෙනස් කිරීම.

<u>මේ අනුව ගැටුම් විපරිනාමයේ දී ගැටුමට සම්බන්ධ **සමාජ හා දේශපාලන මූලාශ්‍ර** කෙරෙහි පුළුල් අවධානයක් යොමු කිරීමට සිදු වේ</u>. එමගින් ගැටුම් හා සම්බන්ධ **සෘණාත්මක** (නිශේධනාත්මක) බලවේග **ධනාත්මක** (ප්‍රතිජානාත්මක) වෙනස්කම් බවට පත් කරනු ලැබේ.

**පීටර් වෙලනස්ටීන්** දක්වන ආකාරයට සාර්ථක ගැටුම් විපරිනාම ක්‍රියාවක් යනු, **<u>ගැටුමේ පාර්ෂව වල ගැටුමට තුඩුදී ඇති හේතූන් සහ ගැටුමේ පරමාර්ථයෙන් වෙනස් කිරීම වේ</u>**. එමගින් එම පාර්ෂව අතර ගැටුමක් හෝ යුද්ධයක් මතු වේ යැයි තවදුරටත් බියක් ඇති නොවේ. **<u>ගැටුම පරිනාමනය මගින් ගැටුම් පාර්ෂව වල ආශාවන්, අභිප්‍රායන් , අවශ්‍යතාවයන් සහ ස්වයං අර්ථකථනයන් සැබෑ ලෙසට වෙනස් කරයි</u>**. එය සාර්ථක ගැටුම් නිරාකරණයකට මෙන්ම තිරසාර සාමය කෙරෙහි ද මග පෑදීමක් වන්නේ ය.

**මේරයින්** විසින් ගැටුම් විපරිනාමය සිදු කළ හැකි ආකාර කිහිපයක් පෙන්වා දෙයි.

**සන්දර්භ විපරිනාමය.**

සන්දර්භ විපරිනාමය යනු ගැටුම ව්‍යාප්ත වී ඇති සන්දර්භය තුළ යම් යම් වෙනස් කම් සිදුකිරීමයි. ගැටුමක් බොහෝ විට සමාජ, කලාපීය සහ ජාත්‍යන්තර සන්දර්භය තුළ ව්‍යාප්ත වේ. මෙම සන්දර්භ තුළ සිදුවන වෙනස්කම් ගැටුමේ පාර්ෂව අතර වෙනස්කම් හා සබඳතාවයන් වෙනස්වීමට බලපායි.

**ව්‍යූහාත්මක විපරිනාමය.**

ගැටුමේ ව්‍යූහය විපරිනාමනය කිරීම යනු, ගැටුමට සම්බන්ධ ක්‍රියාකාරීන්, ගැටළු හා ප්‍රශ්න , පරස්පර විරෝධී ආශයන් හා ඊට අදාළ සම්බන්ධතා සියල්ල වෙසන් කිරීමයි. මෙය ගැටුම් නිරාකරණය සඳහා අත්‍යාවශ්‍ය වේ.

**ගැටළු විපරිනාමය.**

ගැටුම් වල පදනම වන්නේ ඉතා ගැඹුරට මුල්බැස ගත් ගැටළුවක් හෝ ගැටළුය. එම ගැටළු වෙනත් දිශානතියකට චලනය කිරීම ගැටළු විපරිනාමය ලෙස සරලව හැඳින්විය හැකිය. එමගින් ගැටුමට අදාළ පාර්ෂව අතර ස්ථාවරයන්, අපේක්ෂාවන්, සම්බන්ධතා පරිනාමය වීම සඳහා සානුබලයක් වේ. බොහෝ දික්ගැසුණු ගැටුම් විසඳීම සඳහා එම ගැටුමට අදාළ පදනම් ප්‍රශ්න වල දිශානතිය වෙනස් කිරීම වැදගත් වේ.

**ක්‍රියාකරුවන් විපරිනාමය.**

ගැටුමට අදාළ පාර්ෂවයන් ස්වකීය අරමුණුවල දිශානතිය නැවත නිර්වචනය කිරීමට, නවීකරණය කිරීමට, අතහැර දැමීමට, බහුවිධ ඉලක්කයන් පිළිගැනීමට පෙළඹිය හැකිය. එය ක්‍රියාකරුවන් විපරිනාමය ලෙස හැඳින්විය හැකිය. ඒ සඳහා නායකත්වය වෙනස් වීම, ක්‍රියාකරුවන් වෙනස් වීම, නව අරමුණු , නව විශ්වාසයන් පිළිගැනීම හේතුවේ.

**පුද්ගල සහ පුද්ගල කණ්ඩායම් විපරිනාමය.**

සරලව දක්වන්නේ නම් ගැටුමට අදාළ පුද්ගල හා පුද්ගල කණ්ඩායම් වල මනෝභාවයන් විපරිනාමය කිරීම මීට අදාළ වේ. බුදුන්වහන්සේගේ ධර්මයට අනුව මනස සහ හදවත තුළ ලෝභ , ද්වේෂ, මෝහ යන අකුසල මූල ඉවත්කර අලෝභ , අදෝස , අමෝහ ස්ථාපනය කළ යුතු ය.

- <u>සාම අධ්‍යාපනය.</u>

සාම අධ්‍යාපනය යනු දීර්ගකාලීන සිවිල් යුද්ධයකින් පසුව සාධනීය (විධිමත්) සාමයක් කරා සමාජය මෙහෙ වනු ලබන උපකරණය වේ.

